# රජයේ දැන්වීමයි

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2010

උක්ත විභාගයේ ප්‍රතිඵල විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත තැපැල් කර යවා ඇත.

ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අයදුම්කරුවන් විසින් ආදර්ශ අයදුම්පතට අනුව පිළියෙල කරන ලද සෙන්ටිමීටර 30 X 20 ප්‍රමාණයේ ඉල්ලුම් පත්‍ර **2010.12.21** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, **විභාග කොමසාරිස් ජනරාල්, ඇගයීම් (පාසල් විභාග) ශාඛාව, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට පමණක් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරෙහි " **නැවත සමීක්ෂණය (උසස් පෙළ) - 2010** " යන්න සඳහන් කළ යුතුය.

| |
|---|
| ප්‍රතිඵල නැවත සමීක්ෂණයේ දී සම්පූර්ණ පිළිතුරු පත සමීක්ෂණ මණ්ඩල කිහිපයක් යටතේ පරීක්ෂාවට ලක් කරනු ලැබේ. එහි දී ඇගයීමට භාජනය නොවූ පිළිතුරු හෝ පිළිතුරු කොටස් ඇත්නම් ඒවා නැවත ලකුණු කිරීමත් ගණිතමය දෝෂ නිවැරදි කිරීමත් සිදුවේ. මෙහිදී ලකුණුවල/ Z ලකුණුවල හෝ ලැබී ඇති ශ්‍රේණියේ අඩුවීමක් හෝ වැඩිවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දනගත යුතු බව අවධාරණය කරමි. |

සැ.යු. **වැරදි තොරතුරු ඇතුළත් නැවත සමීක්ෂණ ඉල්ලුම් පත් සහතික කොට ඉදිරිපත් කිරීමෙන් විභාග දෙපාර්තමේන්තුව මහත් අපහසුතාවයට පත්වන බැවින් ඉල්ලුම්පතෙහි සඳහන් තොරතුරු ප්‍රතිඵල ලේඛනය අනුව නිවැරදි බවට පෞද්ගලිකවම සෑහීමකට පත්වීමෙන් පසුව පමණක් විදුහල්පති අත්සන යොද සහතික කළ යුතු බව අවධාරණය කරමි.**

**ඉල්ලුම් පත පිළියෙල කිරීමේ දී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.**

01. පාසල් අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර විදුහල්පති මගින් එවිය යුතු අතර, විදුහල්පති එම ඉල්ලුම් පත්‍ර සියල්ලම පරීක්ෂා කර උපලේඛනගත කොට එකම කවරයක බහා ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. පෞද්ගලික අයදුම්කරුවන් තම ඉල්ලුම්පත ඉහත ලිපිනයට එවිය යුතුය.

02. ඉල්ලුම් පත්‍රය ආදර්ශ ආකෘතිය අනුවම පිළියෙල කළ යුතුය.

03. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 250/- කි. තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ නියමිත ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබා ගෙන ඉල්ලුම් පත්‍රයෙහි **පසු පිටෙහි නොගැලවෙන සේ හොඳින් අලවා එවිය යුතුය.** එහි අංකය ද, ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි කළ රිසිට් පත ද අයදුම්කරු ළඟ තබා ගත යුතුය. (හැකිනම් මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් යෝග්‍ය වේ.)

04. මුද්දර, චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් භාර නොගන්නා අතර, ඉහත 03 ඡේදයේ සඳහන් ආකාරයට හැර වෙනත් ක්‍රමවලින් කරන ගෙවීම් භාර ගනු නොලැබේ.

05. එක් එක් විෂයය සඳහා වෙන් වෙන්ව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කල යුතුය.

06. ප්‍රතිඵල ලේඛනයේ දක්වා ඇති පරිදි විභාග අංකය, මධ්‍යස්ථාන අංකය, විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම, විෂයය හා විෂයය අංකය, ලැබූ ශ්‍රේණිය සහ මාධ්‍යය නිවැරදිව ලිවිය යුතුය.

07. වැරදි හෝ අසම්පූර්ණ හෝ තොරතුරු සපයා ඇති ඉල්ලුම් පත්‍ර සහ අවසාන දිනට පසුව එවන ඉල්ලුම් පත්‍ර හා නියමිත ගාස්තුව ගෙවා නොමැති ඉල්ලුම් පත්‍ර නැවත දනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ගෙවා ඇති ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ

08. පෞද්ගලික අයදුම්කරුවන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයෙහි ඇතුළත් 1 සිට 7 දක්වා තොරතුරු පමණක් සඳහන් කිරීම ප්‍රමාණවත්ය.

09. **12 - සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30 කට වඩා අඩුවීම හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ට එම විෂයය සඳහා ද නැවත සමීක්ෂණ අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.**

10. මෙම දන්වීම සහ ආදර්ශ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.Exams.gov.lk) පළ කර ඇත.

ඇගයීම් (පාසල් විභාග) ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503 - කොළඹ
2010.12 දින

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ. පෙ. අංක. 07,
පැලවත්ත - බත්තරමුල්ල.

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්

මෙම ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ආදර්ශ අයදුම්පත (සෙ.මී. 30 x 20)

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2010
## ප්‍රතිඵල නැවත සමීක්ෂණය

01. I ඉල්ලුම්කරුගේ නම : පූජ්‍ය ............................................................................................................හිමි/මයා/මිය/මෙනෙවිය
(මුලකුරු සමග)

II පෞද්ගලික ලිපිනය : ..............................................................................................................................................

02. I විභාග අංකය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

II මධ්‍යස්ථාන අංකය

| | | | |
|---|---|---|---|
| | | | |

03. ඔබ පාසල් අයදුම්කරුවෙක් ද? | ඔව් | නැත |
*(අනවශ්‍ය වචන කපා හරින්න)*

04. විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම : ..............................................................................................

05. නැවත සමීක්ෂණය කළයුතු විෂයය
*(එක් විෂයයක් සඳහා එක් ඉල්ලුම් පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතුය)*

I [ ]

II විෂයය අංකය [ ]

III ලැබූ ශ්‍රේණිය [ ]

IV මාධ්‍යය [ ]

06. ............................................. දිනැති කුවිතාන්සි අංක ............................................. යටතේ ...................................
තැපැල්/උපතැපැල් කාර්යාලයට රුපියල් දෙසීය පනහක් (250/-) ක් ගෙවන ලද බවට සහතික කරමි.

සැ.යු. තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි, මෙහි පසු පිටෙහි හොඳින් අලවන්න. එහි ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න. කුවිතාන්සියේ මුල් පිටපත අලවා නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවට ප්‍රකාශ කරමි. යම් අසත්‍ය තොරතුරක් සපයා තිබේ නම්, මෙම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබීමට ද, නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන වෙනසක දී ලකුණු / Z ලකුණු සහ ලැබූ ශ්‍රේණියේ අඩුවීමක් හෝ වැඩිවීමක් හෝ භාර ගැනීමට ද නැවත සමීක්ෂණය පිළිබඳ නීතිරීතිවලින් බැඳී සිටීමට ද එකඟ වන බව ප්‍රකාශ කරමි.

දිනය : .........................................

.........................................................................
අයදුම්කරුගේ අත්සන

08. **පාසල් අයදුම්කරුවන් සඳහා විදුහල්පතිගේ සහතිකය:**

ඉහත නම සඳහන් අයදුම්කරු මාගේ විදුහලේ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක බවත්, මෙහි දක්වා ඇති විභාග අංකය, මධ්‍යස්ථාන අංකය, විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම, විෂයය අංකය හා විෂයය ලැබූ ශ්‍රේණිය සහ මාධ්‍යය ප්‍රතිඵල ලේඛනය අනුව නිවැරදි බවටත්, **මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත මෙම අයදුම්පතේ පසුපිටෙහි හොඳින් අලවා ඇති බවටත්** සහතික කරමි.

විදුහලේ නම සහ ලිපිනය : ......................................................................

.....................................................
විදුහල්පතිගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය: ...................................................

සැ.යු. ***පෞද්ගලික අයදුම්කරුවන් 01 සිට 07 දක්වා ඡේද පමණක් සම්පූර්ණ කර ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුවේ.***